# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/32 - 2022 ඔක්තෝබර් මස 11 වැනි අඟහරුවාදා - 2022.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

#### නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (1) ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් පත් කරන ලද රාජ්‍ය අමාත්‍යවරුන් වෙත විෂයයන් සහ කාර්යයන් පැවැරීම වහාම ක්‍රියාත්මකවන පරිදි මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෛද්‍ය රමේෂ් පතිරණ,
කර්මාන්ත අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 11 වැනි දින,
කර්මාන්ත අමාත්‍යාංශය,
කොළඹ 03.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය I

**ගරු චාමර සම්පත් දසනායක, ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය හා ආයෝජන වැඩ පිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම. | 1. ලංකා ලේලන්ඩ් ලිමිටඩ්<br>2. ලංකා අශෝක ලේලන්ඩ් ලිමිටඩ්<br>3. සීමාසහිත ජාතික කඩදාසි සමාගම<br>4. සීමාසහිත කහගොල්ල ඉංජිනේරු සේවා සමාගම (KESCO)<br>5. ජාතික ලුණු සමාගම<br>6. සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම<br>7. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව<br>8. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්<br>9. ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය)<br>10. සීමාසහිත බී සී සී සමාගම<br>11. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය<br>12. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය | කර්මාන්ත සංවර්ධන පනත (1969 අංක 36)<br><br>කර්මාන්ත ප්‍රවර්ධන පනත (1990 අංක 46)<br><br>ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි පනත (2006 අංක 17)<br><br>ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරි පනත (අංක 1993 අංක 50) |

උපලේඛනය II

**ගරු ප්‍රසන්න රණවීර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය හා ආයෝජන වැඩ පිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු , රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම. | 1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය<br>2. කුඩා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම<br>3. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අධිකාරිය<br>4. දැව ආශ්‍රිත නිර්මාණ මධ්‍යස්ථානය<br>5. ජාතික ශිල්ප සභාව<br>6. පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව<br>7. ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත හා ඇඟලුම් ආයතනය<br>8. ලංකා ටෙක්ස්ටයිල් මිල්ස් එම්පෝරියම් ලිමිටඩ්<br>9. ලංකා සළුසල ලිමිටඩ්<br>10. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය<br>11. ජාතික මෝස්තර මධ්‍යස්ථානය | කර්මාන්ත සංවර්ධන පනත (1969 අංක 36)<br><br>කර්මාන්ත ප්‍රවර්ධන පනත (1990 අංක 46)<br><br>ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි පනත (2006 අංක 17) |

EOG 10-0094

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.